මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
Ministry of Mahaweli Development and Environment

"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
"சம்பத்பாய", இல: 82, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல, ஸ்ரீ லங்கா.
"Sampathpaya", No 82, Rajamalwatta Road, Battaramulla, Sri Lanka.
Gen.Tel. + 94-11-2882112 - 3

ලේකම් / செயலாளர் / Secretary +94-11-2877290
ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2877292

මගේ අංකය / எனது இல / My No — 03/02/02/TF
ඔබේ අංකය / உமது இல / Your No —
දිනය / திகதி / Date — 2017.03. 31

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සියළුම රාජ්‍ය ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්
සියළුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**රජයේ ඉඩම්වල ගස් ඉවත් කිරීම**

අසීමිත මිනිස් අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ දී ස්වභාවික සම්පත් සීඝ්‍රව හායනය වන අතර ශාක සම්පත කෙරෙහි මෙයින් ඇතිවන අහිතකර බලපෑම අති විශාලය. විශේෂයෙන් විවිධ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පරිහරණය කිරීමට යාමේදී ගස් ඉවත් කිරීමට සිදුවන අතර එමගින් පාරිසරික ගැටළු රැසක් ඉස්මතු වේ. දැනට ක්‍රියාත්මක වන විවිධ අණ පනත්හි දක්වා ඇති විධිවිධාන යටතේ ගස් ඉවත් කිරීම සඳහා අදාල බලධාරීන් වෙතින් අනුමැතීන් ලබා ගැනුනද, එසේ ගස් ඉවත් කිරීමෙන් සිදුවිය හැකි අයහපත් පාරිසරික බලපෑම් හේතුවෙන් ඇති වන පරිසර අනාරක්ෂිතතාව පිළිබඳව පුළුල්ව හා වැඩිදුරටත් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වී ඇත.

2. එබැවින් පහත සඳහන් රජයේ ඉඩම්වල හෙක්ටයාර 01ක් ඉක්මවන භූමි ප්‍රමාණයකින් එකවර ගස් 300ක් ඉක්මවා හෙළීමට සිදුවන අවස්ථාවන්වලදී පමණක්, නියමිත නෛතික අවසරයන් ලබා දෙනු ලබන ආයතන වලින් ගස් ඉවත් කිරීම සඳහා අදාළ සියළු අනුමැතීන් ලබා ගත් පසු මෙම අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

1. වන සංරක්ෂණ ආඥා පණත යටතේ පාලනය වන ඉඩම්
2. වන ජීවී හා වෘක්ෂලතා ආඥා පණත යටතේ පාලනය වන ඉඩම්
3. ජාතික පාරිසරික පණත යටතේ සංවේදී කලාප ලෙස නම් කර ඇති ප්‍රදේශ
4. මහවැලි අධිකාරිය යටතේ පවතින ඉඩම්
5. ඉඩම් කොමසාරිස් ජනරාල් යටතේ පවතින ඉඩම්
6. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් පාලනය වන ඉඩම්
7. විහාර දේවාලගම් පණත මගින් පාලනය වන ඉඩම්
8. රාජ්‍ය වැවිලි සංස්ථා හා වැවිලි සමාගම් මගින් පාලනය වන ඉඩම්

3. ගස් ඉවත් කිරීම සඳහා එකඟතාවය ලබා ගැනීමට ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම ගස් ඉවත් කිරීම හේතුවෙන් සිදුවන පරිසර හානිය අවම කර ගැනීම සහතික කරනු වස් නැවත වන වගාවන් සිදුකරමින් පරිසර පද්ධතිය ප්‍රතිස්ථාපනය හා සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නංවන වග තහවුරු කෙරෙන සැලසුමක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර එම සැලැස්මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම් නිසි ලෙස සිදුවන්නේද යන්න පිළිබඳව නිරන්තර පසු විපරම් කටයුතු සිදුකිරීම අනුමැතිය ලබා දෙන බලධාරීන් විසින් සිදු කලයුතු වේ.

උදය ආර් සෙනෙවිරත්න
ලේකම්

පිටපත් :

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කරු. දැ.ගැ.පි | |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු. දැ.ගැ.පි | |
| 3. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - කරු. දැ.ගැ.පි | |
| 4. | විගණකාධිපති | - කරු. දැ.ගැ.පි | |
| 5. | පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය | - කරු. දැ.ගැ.පි/ අ.ක.ස | |
| 6. | වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.පි/ අ.ක.ස | |
| 7. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | - කරු. දැ.ගැ.පි/ අ.ක.ස | |
| 8. | සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය | - කරු. දැ.ගැ.පි/ අ.ක.ස | |
| 9. | සභාපති, රාජ්‍ය දැව සංස්ථාව | - කරු. දැ.ගැ.පි/ අ.ක.ස | |
| 10. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු | - කරු. දැ.ගැ.පි/ අ.ක.ස | |

"මේ මහපොළොව සහ ගහකොළ මිනිසාට මෙන්ම අහසේ පියාසරන සියොතුන්ට ද මිහිමත සරන සිවුපාවුන්ට ද සියලු සතුන්ට ද එකසේ අයිතිය"
"நாம் வாழும் இந்த பூமி மற்றும் மரம் செடி கொடிகள் மனிதனுக்கு மட்டுமன்றி வான் வெளியில் பறந்து திரியும் பறவைகள் மற்றும் பூமியிலுள்ள விலங்குகளுக்கும், ஏனைய அனைத்து விலங்குகளுக்கும் சொந்தமானது."
"This great earth and the flora on it equally belong to the man and the birds flying in the sky, the quadrupeds and all creatures living on earth"